# මීගමුව අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම - 2024

Learning Resource Centre
R
De Mazenod College
Kandana

**11 ශ්‍රේණිය**

| | | |
|---|---|---|
| ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය | I, II | පැය තුනයි. |
| வணிகக் கல்வியும் கணக்கீடும் | I, II | மூன்று மணித்தியாலம் |
| Business and Accounting Studies | I, II | Three hours |

*අමතර කියවීම් කාලය – මිනිත්තු 10 යි.*
*மேலதிக வாசிப்பு நேரம் – 10 நிமிடங்கள்*
*Additional Reading Time – 10 minutes*

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I

උපදෙස්

i) සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ii) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ගන්න.

iii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.

iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

01. ඇල්ල සංචාරක ව්‍යාපාර ආයතනයක මුරකරුවෙකු ලෙස සේවය කරන විදුර සතිඅන්තයේ අසනීපයෙන් පෙළෙන තම මව බැලීමට ඉණදාඩි කැම වර්ග රැගෙන තම නිවසට පැමිණියේ ය.

මෙම සිද්ධියේ තද අකුරින් ඇති අවස්ථා අනුපිළිවෙලින් දක්වෙන පිළිතුර තෝරන්න.

1) ප්‍රවාහනය, බෙහෙත්, ආහාර
2) ආරක්ෂාව, සෞඛ්‍ය, ආහාර
3) ප්‍රවාහනය, සෞඛ්‍ය, ආරක්ෂාව
4) ආරක්ෂාව, ආහාර, බෙහෙත්

02. සංචාරක කර්මාන්තයට ඇති තර්ජනයක් නොවන්නේ,

1) සංචාරක ක්ෂේත්‍රයේ ව්‍යාපාර බහුල වීම.
2) සේවකයන්ගේ භාෂා දැනුම අල්ප වීම.
3) සාමකාමී පරිසරයක් රට තුළ පැවතීම.
4) දේශීය භාණ්ඩ මිල ගණන් ඉහළ යාම.

03. ව්‍යාපාර ආයතනයකට රජය හා අයිතිකරුවන් ඇල්මක් දක්වීමට බලපාන කරුණු පිළිවෙලින් ඇතුළත් පිළිතුර වන්නේ,

1) රැකියා අවස්ථා උත්පාදනය, රැකියා වර්ධනය හා රැකියා තෘප්තිය
2) රැකියා වර්ධනය හා රැකියා තෘප්තිය, තීරණ ගැනීම හා එම තීරණ ක්‍රියාත්මක කිරීම.
3) ජාතික නිෂ්පාදිතය වර්ධනය කිරීම, රැකියා සුරක්ෂිත බව
4) බදු ආදායම නිසි ලෙස ලබා ගැනීම, ව්‍යාපාරයේ අනාගත වර්ධනය

04. ආර්ථික පරිසර සාධකයක් වන්නේ,

1) අයවැය ප්‍රතිපත්ති
2) අණපනත් හා නීතිරීති
3) උද්ධමනය
4) තොරතුරු පද්ධති

05. හවුල් ව්‍යාපාරයක හවුල්කරුවන් සංඛ්‍යාව නිර්ණය කරනුයේ,

1) 1890 හවුල් ආඥා පනත යටතේ ය.
2) වංචා වැළැක්වීමේ ආඥා පනත යටතේ ය.
3) 2007 අංක 07 සමාගම් පණත යටතේ ය.
4) ව්‍යාපාර නාම ආඥා පණත යටතේ ය.

06. පහත වාක්‍ය ඛණ්ඩ අතරින් ව්‍යාපාර සංවිධාන සම්බන්ධ වැරදි ප්‍රකාශ වන්නේ,
1) සියලුම ලාභ අයිතිකරු සතුවීම ඒක පුද්ගල ව්‍යාපාරවල ලක්ෂණයකි.
2) 1890 හවුල් ව්‍යාපාර ආඥා පනත අනුව ආරම්භක ප්‍රාග්ධනය 1000 වැඩි නම් ලිඛිත ගිවිසුමක් පවත්වාගත යුතුය.
3) සාමාජික සුභසාධනය වෙනුවෙන් කටයුතු කිරීම සමූපකාර සමිතියක වාසියකි.
4) ලාභය හා අයිතිය බෙදී යාම සමාගම්වල වාසියකි.

07. සීමාසහිත මීගමු විවිධ සේවා සමුපකාර සමිතිය .........(1)......... අංශයේ .........(2).......... ව්‍යාපාර සංවිධානයකි. ඉහත (1) හා (2) ස්ථානවලට අදාළ නිවැරදි යෙදුම් පිළිවෙලින් දක්වෙන පිළිතුර තෝරන්න.
1) පෞද්ගලික, ලාභ අරමුණු කරගත්
2) පෞද්ගලික, ලාභ අරමුණු කර නොගත්
3) පොදු, ලාභ අරමුණු කරගත්
4) පොදු, ලාභ අරමුණු කර නොගත්

08. වාණිජ බැංකුවක් විසින් සපයනු ලබන පහසුකම් කිහිපයක් පහත දක්වේ.
A - අයිරා පහසුකම් ලබාදීම.
B - තැන්පතු සඳහා පොලී ගෙවීම.
C - ස්ථාවර නියෝග ක්‍රියාත්මක කිරීම.
D - චෙක්පත් මගින් ගෙවීම් කිරීම.
ඉහත දෑ අතුරින් ජංගම ගිණුම් හිමියෙකුට පමණක් ලබාගත හැකි පහසුකම් වන්නේ,
1) A හා C
2) A හා D
3) B හා D
4) C හා D

09. පසුගිය සතියේ මහත් ආන්දෝලනයකට මංපෑදුනු කතාබහට ලක්වූයේ ශ්‍රී ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව ඉන්ධන මිල ගණන් සංශෝධනය කිරීමයි. මෙම ප්‍රකාශය තුළ ගම්‍ය වන ප්‍රවාහන මූලිකාංගය කුමක් ද?
1) මාර්ගය
2) මාධ්‍ය
3) බලය
4) පර්යන්තය

10. සෑම වාණිජ බැංකුවක් ම නිකුත් කරන චෙක්පත්වල චුම්බක තීන්ත අක්ෂර හැඳුනුම් තීරුවක් දක්නට ඇත (MICR). එම තීරුවේ අංක අනුපිළිවෙලින් දක්වෙන පිළිතුර වන්නේ,
1) බැංකු ගිණුම් අංකය, බැංකු ශාඛා අංකය, බැංකුවේ අංකය, චෙක්පත් අංකය
2) චෙක්පත් අංකය, බැංකුවේ අංකය, බැංකු ශාඛා අංකය, බැංකු ගිණුම් අංකය
3) චෙක්පත් අංකය, බැංකු ගිණුම් අංකය, බැංකුවේ අංකය, බැංකු ශාඛා අංකය
4) බැංකුවේ අංකය, බැංකු ශාඛා අංකය, බැංකු ගිණුම් අංකය

11. පුංචි බණ්ඩා උපන්දා සිටම පාදයේ ආබාධයක් ඇති අයෙකි. ඔහු ජීවිත රක්ෂණයක් සඳහා රක්ෂණ යෝජනා පත්‍රයක් ඉදිරිපත් කළ අතර එහි ආබාධ ඇත් ද? යන ප්‍රශ්නයට "නැත" වශයෙන් පිළිතුරු සපයා තිබුණි. බිඳ වැටී ඇති රක්ෂණ මූලධර්මය වන්නේ,
1) හානිපූරණය
2) දායකත්වය
3) රක්ෂ්‍ය හිමිකම
4) උපරිම විශ්වාසය

12. ටිකිරි තම ගෙවත්තේ වගා කරන පළතුරු වෙළඳසැලක් පවත්වාගෙන යන බිංදුට අලෙවි කරයි. බිංදුගෙන් මිලදී ගත් පලතුරු ඉතා රසවත් බව විදුරගේ බිරිඳ පවසයි. ඉහත සිද්ධියට අනුව නිවැරදි ප්‍රකාශය තෝරන්න.
1) බිංදු, ටිකිරිගෙන් පලතුරු මිලදී ගැනීම තොග වෙළඳාමකි.
2) විදුර, බිංදුගෙන් පලතුරු මිලදී ගැනීම තොග වෙළඳාමකි.
3) බිංදු, විදුරට පලතුරු විකිණීම තොග වෙළඳාමකි.
4) ටිකිරි, බිංදුට පලතුරු විකිණීම සිල්ලර වෙළඳාමකි.

13. පරාක්‍රම මහ විද්‍යාලයේ 2022 වර්ෂයේ වාර්ෂික සැලසුමට අනුව අපේක්ෂිත සා/පෙළ සමත් ප්‍රතිශතය 90% ක් විය. නමුත් 2023 සා/පෙළ ප්‍රතිඵල ලැබුනේ 70% කි. අපේක්ෂිත ප්‍රතිඵල නොලැබීම පිළිබඳ සොයා බලන ලදී. මෙයට අදාළ කළමනාකරණ කාර්යය වන්නේ,
1) සැලසුම්කරණය
2) සංවිධානකරණය
3) මෙහෙයවීම
4) පාලනය

14. තම නිවසේ සිට විවිධ කුළුබඩු සාදන මිහිරි **සුරක්ෂිත** ඇසුරුම්වල බහා නිවසර පැමිණෙන්නන් හට අලෙවි කරයි. විශාල ඇණවුම් **ණය පදනමට** ලබාදෙන අතර ඔවුන්ගේ **නිවෙස්වලට ප්‍රවාහනය** කර දීමට ද කටයුතු කරයි. නිවස ඉදිරිපිට විවිධ කුළුබඩු අලෙවි කරන බව **බැනරයක** ප්‍රදර්ශනය කර ඇත.

ඉහත සිද්ධියේ ඉරි ඇඳි අලෙවිකරණ මිශ්‍රයේ විචල්‍යයන් ඇතුළත් පිළිතුර වන්නේ,

1) නිෂ්පාදිතය, මිල, ස්ථානය, ප්‍රවර්ධනය
2) බෙදාහැරීම, ප්‍රවර්ධනය, නිෂ්පාදිතය, මිල
3) ප්‍රවර්ධනය, මිල, ස්ථානය, නිෂ්පාදිතය
4) ගුණත්වය, මිල, ස්ථානය, ප්‍රවර්ධනය

15. කල්ප පවත්වාගෙන යන මල් වෙළෙඳසැලට අවශ්‍ය මල් තොගයක් චාමරගෙන් ලබා ගත් අතර එහි වටිනාකම රු. 50,000 තම මහජන බැංකුවේ චෙක්පතකින් පියවන ලදී. ඔහු එම චෙක්පත ඔහුගේ ලංකා බැංකු ජංගම ගිණුමේ තැන්පත් කරන ලදී.

ඉහත සිද්ධියේ චෙක්පතේ අණකරු, ආදායකයා, අණලද්දා පිළිවෙලින් ඇතුළත් පිළිතුර වන්නේ,

1) කල්ප, චාමර, මහජන බැංකුව
2) චාමර, කල්ප, ලංකා බැංකුව
3) කල්ප, මහජන බැංකු, චාමර
4) චාමර, ලංකා බැංකුව, කල්ප

16. ලප කැළැල් ඉවත් කරන ඖෂධ නිෂ්පාදිතයක් වෙළඳපොළට හඳුන්වා දුන් ආරියරත්න අලෙවි කටයුතු සඳහා කළමනාකරුවන් පත් කිරීම ........................ වන අතර සැපයුම් කළ පරිදි එම ඖෂධ අලෙවි කර ඇත්දැයි සොයා බැලීම ............................ වේ.

හිස්තැන් සඳහා ගැළපෙන පද පිළිවෙලින් දක්වෙන පිළිතුර වන්නේ,

1) සංවිධානකරණය, පාලනය
2) සැලසුම්කරණය, සංවිධානකරණය
3) මෙහෙයවීම, පාලනය
4) සැලසුම්කරණය, පාලනය

17. පහත සඳහන් ගනුදෙනු අතරින් හිමිකම වැඩිවීමට බලපාන ගනුදෙනුව වන්නේ,

1) රු. 4,000 ක් විදුලි ගාස්තු ගෙවීම.
2) රු. 5,000 කඩකුලී ආදායම ලැබීම.
3) 5% ක වට්ටමකට යටත්ව ණයගැතියන්ගෙන් මුදල් ලැබීම.
4) අයිතිකරු රු. 1,000 ක් ගැතිලි ගැනීම.

18. "ව්‍යාපාරයේ අයිතිකරු විසින් තම පෞද්ගලික ප්‍රයෝජනය සඳහා ව්‍යාපාරයෙන් රු. 15,000 ක් ලබා ගැනීම."
ඉහත ගනුදෙනුව මගින් ව්‍යාපාරයේ ගිණුම්කරණ සමීකරණයට වන බලපෑම වනුයේ,

1) වත්කම් වැඩිවීම රු. 15,000 - හිමිකම වැඩිවීම රු. 15,000
2) වත්කම් අඩුවීම රු. 15,000 - හිමිකම අඩුවීම රු. 15,000
3) වත්කම් වැඩිවීම රු. 15,000 - හිමිකම අඩුවීම රු. 15,000
4) වගකීම් වැඩිවීම රු. 15,000 - හිමිකම වැඩිවීම රු. 15,000

❖ **පහත තොරතුරු උපයෝගී කරගෙන ප්‍රශ්න අංක 19, 20 ට පිළිතුරු සපයන්න.**

හරේන්ද්‍රගේ ව්‍යාපාරය රු. 1,000 ක භාණ්ඩ තොගයක් 10% ක වෙළෙඳ වට්ටමක් අඩු කරගෙන ණයට විකුණන ලදී. මුදල් ලබා ගැනීමේ දී 10% ක මුදල් වට්ටමක් අඩුකර ඇත.

19. ඉහත ගනුදෙනු හරේන්ද්‍රගේ ව්‍යාපාරයේ ගිණුම්කරණ සමීකරණයේ දක්වූ විට හිමිකමට වන බලපෑම වන්නේ,

1) රු. 10,000 කින් වැඩිවීම.
2) රු. 1,000 කින් අඩුවීම.
3) රු. 900 කින් අඩුවීම.
4) රු. 900 කින් වැඩිවීම.

20. ව්‍යාපාරයට මුදල් ලැබීම සම්බන්ධ නිවැරදි ද්විත්ව සටහන කුමක් ද?

1) මුදල් ගිණුම හර 9,000
ණයගැති ගිණුම බැර 8,100
දුන් වට්ටම් ගිණුම බැර 900

2) මුදල් ගිණුම හර 10,000
ණයගැති ගිණුම බැර 9,000
දුන් වට්ටම් ගිණුම බැර 1,000

3) මුදල් ගිණුම හර 8,100
දුන් වට්ටම් ගිණුම හර 900
ණයගැති ගිණුම බැර 9,000

4) මුදල් ගිණුම හර 9,100
දුන් වට්ටම් ගිණුම බැර 9,000

21. පහත X තීරුව හා Y තීරුව ගැළපූ විට නිවැරදි පිළිතුර තෝරන්න.

| X | Y |
|---|---|
| 1. විකුණුම් ගිණුම | A. හිමිකම් ගිණුම |
| 2. ගැනිලි ගිණුම | B. ආදායම් ගිණුම |
| 3. රක්ෂණ ගාස්තු ගිණුම | C. වියදම් ගිණුම |
| 4. උපචිත වැටුප් ගිණුම | D. වගකීම් ගිණුම |

X තීරුව හා Y තීරුව පිළිවෙලින් ගැළපූ විට පිළිතුර වන්නේ,

1) B, A, C, D  2) A, C, D, B  3) C, A, D, B  4) C, D, A, B

22. සඳමාලිගේ ව්‍යාපාරයට රු. 70,000 වටිනා උපකරණ තොගයක් ව්‍යාපාරයේ පාවිච්චිය සඳහා ණයට ගන්නා ලදී.
ඉහත ගනුදෙනුව සටහන් කිරීමට අදාළ මූලාශ්‍ර ලියවිල්ල හා මූලික පොත නිවැරදිව දක්වෙන පිළිතුර කුමක් ද?

1) ඉන්වොයිසිය, පොදු ජ්නලය
2) ඉන්වොයිසිය, ගැනුම් ජ්නලය
3) ජ්නල් වවුචරය, පොදු ජ්නලය
4) මුදල් ගෙවීම් වවුචරය, මුදල් පොත

* පහත තොරතුරු උපයෝගී කරගෙන ප්‍රශ්න අංක 23 හා 24 ට පිළිතුරු සපයන්න.

2023 අගෝස්තු 30 දිනට මහිම ව්‍යාපාරයේ බැංකු ගිණුමේ ශේෂය රු. 6,700 කි. පහත සඳහන් හේතූන් නිසා බැංකු ප්‍රකාශනයේ ශේෂය වෙනස් විය.

A - තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත් රු. 2,000
B - බැංකුවට සෘජුවම ලැබී ඇති ණයගැති ප්‍රේෂණ රු. 500
C - ස්ථාවර නියෝග මත බැංකුව ගෙවා ඇති රක්ෂණ ගාස්තු රු. 1,000

23. ඉහත කරුණු අතරින් බැංකු ගිණුමේ ශේෂය, බැංකු ප්‍රකාශනයේ ශේෂයට වඩා අඩු වීමට බලපාන හේතුව/හේතු වන්නේ,

1) A පමණි.  2) B පමණි.  3) C පමණි.  4) A, C පමණි.

24. 2023 අගෝස්තු 30 වන දිනට සංශෝධිත බැංකු ශේෂය

1) රු. 6,200  2) රු. 4,200  3) රු. 7,200  4) රු. 8,200

25. සුළු මුදල් "අග්‍රිමය ප්‍රතිපූර්ණය" යනුවෙන් අදහස් වන්නේ,

1) කාලච්ඡේදයට අයත් මුදල ලබා දීම.
2) කාලච්ඡේදයේ වියදම් කළ මුදලට සමාන මුදලක් ලබා දීම.
3) කාලච්ඡේදයේ ඉතිරි මුදලට සමාන මුදලක් ලබා දීම.
4) කාලච්ඡේදයේ ඉල්ලුම් කරන මුදල් ප්‍රමාණය ලබාදීම.

26. රාහුල්ගේ ව්‍යාපාරයේ අගෝස්තු මාසයේ සුළු මුදල් වියදම රු. 2,800 කි. ඔහු සතුව මාසය අවසානයේ ඉතිරි ශේෂය රු. 1,200 කි. සැප්තැම්බර් 1 දිනට ප්‍රතිපූර්ණය සඳහා ලද මුදල හා සුළු මුදල් අග්‍රිමයේ වටිනාකම පිළිවෙලින් දක්වෙන නිවැරදි පිළිතුර කුමක් ද?

1) රු. 2,800 හා රු. 1,200
2) රු. 1,200 හා රු. 2,800
3) රු. 2,800 හා රු. 4,000
4) රු. 1,200 හා රු. 4,000

27. රු. 1,000 ක ණයහිමියෙකුට ගෙවන ලද චෙක්පත් බැංකුව විසින් අගරු බව දන්වා එවා තිබුණි. එය ගිණුම්ගත කිරීමට අදාළ ද්විත්ව සටහන වන්නේ,

1) මුදල් ගිණුම හර රු. 1,000 , ණයහිමි ගිණුම බැර රු. 1,000
2) ණයහිමි ගිණුම හර රු. 1,000 , බැංකු ගිණුම බැර රු. 1,000
3) ණයහිමි ගිණුම හර රු. 1,000 , මුදල් ගිණුම බැර රු. 1,000
4) බැංකු ගිණුම හර රු. 1,000 , ණයහිමි ගිණුම බැර රු. 1,000

28. "ෂෙහාන්ගේ ව්‍යාපාරය විසින් රු. 25,000 ක වෙළෙඳ භාණ්ඩ තොගයක් ණයට ගැනීම."
ඉහත ගනුදෙනුවට අදාළ ද්විත්ව සටහන වන්නේ,
1) තොග ගිණුම හර රු. 25,000 - ණයගැති ගිණුම බැර රු. 25,000
2) ගැනුම් ගිණුම හර රු. 25,000 - මුදල් ගිණුම බැර රු. 25,000
3) ගැනුම් ගිණුම හර රු. 25,000 - ණයහිමි ගිණුම බැර රු. 25,000
4) මුදල් ගිණුම හර රු. 25,000 - ගැනුම් ගිණුම බැර රු. 25,000

29. පහත 'X' තීරුව 'Y' තීරුව හා ගැළපූ විට නිවැරදි පිළිතුර වන්නේ,

| X | Y |
|---|---|
| 1. මුදල් ලැබීම් හා ගෙවීම් සම්බන්ධ ගනුදෙනු | A. විකුණුම් ජ'නලය |
| 2. වෙළෙඳ භාණ්ඩ තොග ණයට ගැනීම | B. ගැනුම් ජ'නලය |
| 3. වෙළෙඳ භාණ්ඩ තොග ණයට විකිණීම | C. සුළු මුදල් පොත |
| 4. සුළු මුදල් ගනුදෙනු | D. මුදල් පොත |

1) D, B, C, A
2) B, D, A, C
3) D, B, A, C
4) C, D, B, A

30. ව්‍යාපාරයක දුන් වට්ටම් රු. 1,000 කින් වැඩිවීමට හේතු වන්නා වූ ගනුදෙනුව තෝරන්න.
1) ණයහිමි සුපුන්ට 10% ක වට්ටමකට යටත්ව රු. 10,000 ක් ගෙවීම.
2) ලකුණු කළ මිල රු. 5,000 ක් වූ භාණ්ඩ තොගයක් රු. 4,000 කට අත්පිට විකිණීම.
3) රු. 10,000 ක ණයගැතියෙකු වූ නිපුණගෙන් 10% ක වට්ටමකට යටත්ව මුදල් ලැබීම.
4) රු. 10,000 ක ණයගැතියෙකු වූ සහන්ගෙන් රු. 1,000 ක මුදලක් ලැබීම.

31. පහත දක්වෙන්නේ ගිණුම්කරණයේ දී සිදුවූ වරදක් නිවැරදි කිරීමට අදාළ ජ'නල් සටහනකි.

| | |
|---|---|
| ගැනුම් ගිණුම හර | 1,000 |
| ගැනිලි ගිණුම බැර | 1,000 |

ව්‍යාපාරය ගිණුම් තැබීමේ දී සිදුවී ඇති වරද වන්නේ,
1) ගැනුම් රු. 1,000 ගැනිලි ගිණුමට හර කර තිබීම.
2) ගැනිලි ගිණුමේ රු. 1,000 සටහන් කර තිබීම.
3) ගැනිලි ගිණුමේ රු. 1,000 සටහන් නොවීම.
4) ගැනුම් රු. 1,000 සම්පූර්ණයෙන් පොත් වලින් මඟහැරීම.

Learning Resource Centre
R
De Mazenod College
Kandana

32. 2023.01.01 දින මෝටර් රථයක් රු. 99,000 කට මිලදී ගත් අතර ඵලදායී ජීවිත කාලය 10 කි. සුන්බුන් වටිනාකම රු. 9,000 කි.
2023.12.31 වන දිනට ලාභ හෝ අලාභ ප්‍රකාශයේ දක්විය යුතු ක්ෂය ප්‍රමාණය වන්නේ,
1) රු. 18,000 කි.
2) රු. 9,000 කි.
3) රු. 9,900 කි.
4) රු. 19,800 කි.

33. රාජුගේ ව්‍යාපාරයේ 2023.12.31 දිනට බැංකු ණය පොලිය රු. 9,000 ගෙවා තිබුණු අතර මාසික පොලිය රු. 1,000 කි. මෙම ව්‍යාපාරයේ 2023.12.31 වන විට,
1) ගෙවූ බැංකු ණය පොලි ගිණුමේ ශේෂය රු. 1,000 කි.
2) මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ උපචිත බැංකු ණය පොලි රු. 3,000 කි.
3) මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ උපචිත බැංකු ණය පොලි රු. 12,000 කි.
4) බැංකු ණය පොලි ගිණුමේ ශේෂය රු. 10,000 කි.

* පහත සඳහන් තොරතුරු උපයෝගී කරගෙන 34 සිට 40 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

මධුරගේ ව්‍යාපාරයේ 2023.12.31 වන දිනට ශේෂ පිරික්සුමෙන් උපුටා ගත් තොරතුරු පහත දක්වේ.

| | (රු. '000) |
|---|---|
| ප්‍රාග්ධනය | 300,000 |
| ගැනුම් | 150,000 |
| විකුණුම් | 300,000 |
| ලද වට්ටම් | 5,000 |
| විදුලි වියදම් | 15,000 |
| ප්‍රවාරණ වියදම් | 5,000 |
| රක්ෂණ වියදම් | 10,000 |
| ණයගැතියෝ | 40,000 |
| ණයහිමියෝ | 25,000 |
| මුදල් | 40,000 |
| බැංකු අයිරාව | 10,000 |
| 10% බැංකු ණය | 60,000 |
| මෝටර් රථ | 250,000 |
| ගෙන ඒමේ කුලී | 10,000 |
| බැංකු ණය පොලී | 3,000 |

අතිරේක තොරතුරු,

* මෝටර් රථ 10% ක් ක්ෂය කළ යුතුය.
* 2023.12.31 දිනට තොග රු. 20,000 කි.

34. 2023.12.31 දිනෙන් අවසන් වර්ෂයේ විකුණුම් පිරිවැය
1) රු. 140,000 2) රු. 130,000 3) රු. 170,000 4) රු. 160,000

35. 2023.12.31 දිනෙන් අවසන් වර්ෂයේ දළ ලාභය වන්නේ,
1) රු. 140,000 2) රු. 130,000 3) රු. 160,000 4) රු. 170,000

36. මෙම ව්‍යාපාරයේ බෙදා හැරීමේ වියදමක්, පරිපාලන වියදමක්, මූල්‍ය වියදමක් පිළිවෙලින් දක්වෙන පිළිතුර වන්නේ,
1) ප්‍රවාරණ වියදම්, බැංකු ණය පොලී, රක්ෂණ වියදම්
2) ප්‍රවාරණ වියදම්, රක්ෂණ වියදම්, බැංකු ණය පොලී
3) විදුලි වියදම්, රක්ෂණ වියදම්, බැංකු ණය පොලී වියදම්
4) බැංකු ණය පොලී, විදුලි වියදම්, ප්‍රවාරණ වියදම්

37. මෙම ව්‍යාපාරයේ 2023.12.31 න් අවසන් වර්ෂය සඳහා ශුද්ධ ලාභය වන්නේ,
1) රු. 690,000 2) රු. 109,000 3) රු. 104,000 4) රු. 107,000

38. මෙම ව්‍යාපාරයේ 2023.12.31 දිනට මෝටර් රථ වල ශුද්ධ අගය වන්නේ,
1) රු. 200,000 2) රු. 250,000 3) රු. 225,000 4) රු. 275,000

39. මෙම ව්‍යාපාරයේ 2023.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දක්විය යුතු උපචිත බැංකු ණය පොලිය වන්නේ,
1) රු. 1,000 2) රු. 3,000 3) රු. 6,000 4) රු. 9,000

40. 2023.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දක්විය යුතු මුළු වගකීම වන්නේ,
1) රු. 38,000 2) රු. 88,000 3) රු. 95,000 4) රු. 98,000

2024.08.17 ලද්දේ
Learning Resource Center
R
De Mazenod College
Kandana

## II කොටස

උපදෙස් :-

- පළමුවන ප්‍රශ්නය ඇතුළුව I කොටසෙන් ප්‍රශ්න 2 ක් ද II කොටසෙන් ප්‍රශ්න 2 ක් ද බැගින් තෝරා ගෙන ප්‍රශ්න 5 කට පමණක් පිළිතුරු සපයන්න.

---

01) පහත දක්වෙන සිද්ධිය ඇසුරෙන් අංක (i) සිට (x) දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

චමිල හෝටල් පාඨමාලාවක් තුළින් ආහාරපාන පිළියෙල කිරීම පිළිබඳ මනා අධ්‍යාපනයක් ලබා ඇති අතර ඉන් පසුව සංචාරක හෝටලයක වසර 3 ක් සේවය කර ඇත. නගරයේ නව බස් නැවතුම්පළ ඉදිකිරීමත් සමග ඒ අසල ආපනශාලාවක් ආරම්භ කිරීමේ අදහස ඔහුට ඇති විය. ඔහුට අයත් රු. 1,000,000 (ලක්ෂ 10) වටිනා ගොඩනැගිල්ල ද රු. 600,000 මුදලක් ද යොදා 2023.01.01 දින "ටොපේ ටොප්" හෝටලය ආරම්භ කරන ලදී. ඔහුගේ සහයට ආපනශාලා සේවකයන් දෙදෙනෙකු බඳවා ගෙන ඇත.

2023.01.03 දින ව්‍යාපාරය සඳහා රු. 400,000 ක බැංකු ණයක් මහජන බැංකුවෙන් ලබාගත් අතර ශානිකා ලී බඩු වෙළඳසැලෙන් රු. 100,000 ක ලී බඩු ණයට ගන්නා ලදී. රු. 500,000 ක් වටිනා ආහාර පිළියෙල කිරීමට අවශ්‍ය උපාංග මිලට ගන්නා ලදී.

ජනවාරි මාසය තුළ රු. 85,000 ක ආහාර ද්‍රව්‍ය මිලට ගත් අතර එම මාසය තුළ දී ආහාර සැපයීමෙන් රු. 200,000 ක ආදායමක් ලබා තිබිණි. මිලදී ගත් සියලු ආහාර ද්‍රව්‍ය ජනවාරි 31 දින විකිණී අවසන් වී ඇත. රු. 20,000 ක වැටුප් ද, ජල බිල රු. 1,000 ක් ද, ප්‍රවාහන වියදම රු. 2,000 ක් ද මාසය තුළ ගෙවා ඇත.

ව්‍යාපාර කටයුතු පහසු කර ගැනීම සඳහා ගිණුමක් ආරම්භ කිරීමට බලාපොරොත්තු වන අතර ජනවාරි 31 වන විට රු. 3,000 ක විදුලිගාස්තු ගෙවා නැත.

i) අ) "ටොපේ ටොප්" හෝටලයේ නිෂ්පාදනය කරනු ලබන නිෂ්පාදිතවල ස්වභාවය අනුව කුමන ව්‍යාපාර වර්ගයකට අයත් වේ ද?

ආ) මෙම ව්‍යාපාරයේ දකිය හැකි ශක්තියක් හා අවස්ථාවක් ලියා දක්වන්න.

ii) අ) මෙම ව්‍යාපාරය අයත් වන ව්‍යාපාර සංවිධාන වර්ගය කුමක් ද?

ආ) මෙම ව්‍යාපාරය ලියාපදිංචි කළ යුතු ද? හේතු දක්වන්න.

iii) අ) අරමුණු අනුව වර්ග කිරීමේ දී මෙම ව්‍යාපාරය කුමන වර්ගයකට අයත් වේ ද?

ආ) මෙම ව්‍යාපාරයේ දකිය හැකි කළමනාකරණ ක්‍රියාවලියේ සංවිධානකරණයට අයත් කටයුත්තක් ලියා දක්වන්න.

iv) අ) මෙම ව්‍යාපාරය විසින් ඇරඹිය යුත්තේ කුමන වර්ගයේ ගිණුමක් ද?

ආ) එම ගිණුම පවත්වාගෙන යාමෙන් ව්‍යාපාරයට ලැබෙන ප්‍රයෝජන 2 ක් ලියන්න.

v) 2023.01.01 දිනට ගිණුම්කරණ සමීකරණය අගයන් සහිතව පෙන්වන්න.

vi) මෙම ව්‍යාපාරයේ ආරම්භක ප්‍රාග්ධනය කොපමණ ද?

vii) මෙම සිද්ධියට අදාළ ගනුදෙනු සටහන් කිරීමට යොදාගන්නා මූලාශ්‍ර ලේඛන 2 ක් හා ඊට අදාළ මූලික පොත් දෙක ලියන්න.

viii) "මෙම ව්‍යාපාරයේ රු. 3,000 ක විදුලි ගාස්තු ගෙවා නැත." මීට අදාළ ද්විත්ව සටහන ලියා දක්වන්න.

ix) අ) මෙම ව්‍යාපාරයේ 2023.01.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්විය හැකි ජංගම නොවන වගකීමක් සටහන් කරන්න.

ආ) මෙම ව්‍යාපාරයේ සිදුවී ඇති වත්කම් වැඩිවීම හා වගකීම් වැඩිවීමකට අදාළ ගනුදෙනුවක් ලියන්න.

x) මෙම ව්‍යාපාරයේ 2023.01.31 දිනෙන් අවසන් මාසයේ මෙහෙයුම් ප්‍රතිඵලය කොපමණ දැයි ගණනය කරන්න.

*(ලකුණු 02 x 10 = 20)*



REGISTRAR
De Mazenod College
Kandana.

## I කොටස

02) i) අ) ව්‍යාපාරයක් යන්නෙහි අදහස දක්වන්න.

ආ) ව්‍යාපාරයක පොදුවේ දකිය හැකි අරමුණු දෙක කවරේ ද?

ii) පහත දැක්වෙන ප්‍රකාශන සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

අ) අවශ්‍යතා හා වුවමනා ව්‍යාපාරිකයින්ට නිර්මාණය කළ හැකි ය.

ආ) අයිතිකරුවෝ, කළමනාකරුවෝ, සේවකයෝ හා තරඟකරුවෝ, අභ්‍යන්තර පරිසර සාධක වේ.

ඉ) පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරි පනත මගින් පාරිභෝගිකයන්, ව්‍යාපාරිකයන් හා ව්‍යාපාර ආයතන යන පාර්ශ්ව ආරක්ෂා වේ.

ඊ) නව තාක්ෂණික ක්‍රම සඳහා අනුගත වීම දුෂ්කර වීම ව්‍යාපාරවල දුර්වලතාවයකි.

iii) අ) පරිමාණය අනුව ව්‍යාපාර සංවිධාන වර්ග කරන ප්‍රමාණාත්මක නිර්ණායක 2 ක් දක්වන්න.

ආ) පහත දැක්වෙන ව්‍යාපාර හිමිකාරත්වය අනුව වර්ග කර දක්වන්න.

A - සී/ස ගාමිණී සමාගම

B - අධ්‍යාපන සේවකයින්ගේ සමුපකාර සමිතිය

C - ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව

D - විදේශ සේවා නියුක්ති කාර්යංශය

iv) අ) ඒකපුද්ගල ව්‍යාපාරයක නාමය ලියාපදිංචි කිරීමෙන් ලැබෙන වාසි 2 ක් ලියන්න.

ආ) හවුල් ව්‍යාපාරයකට සාපේක්ෂව සංස්ථාපිත සමාගමක ඇති වාසි 2 ක් නම් කරන්න.

(ලකුණු 02 x 4 = 08)

03) i) සිල්ලර වෙළඳාම හා තොග වෙළඳාම අතර වෙනස්කම් 2 ක් දක්වන්න.

ii) පහත දැක්වෙන ප්‍රකාශන සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

අ) දේපළ රක්ෂණයේ දී වන්දි මුදලට අමතරව ප්‍රසාද දීමනා හිමි නොවේ.

ආ) වේගවත් බව සන්නිවේදනයේ මූලිකාංගයකි.

ඉ) ණය පදනම මත ගනුදෙනු කිරීමට වාණිජ බැංකු මගින් නිකුත් කෙරෙන්නේ හරපත් ය.

ඊ) වෙළඳාමේ වර්ධනය සඳහා උපකාරක සේවාවල වර්ධනය වැදගත් වේ.

iii) ජීවිත රක්ෂණ හා දේපළ රක්ෂණ අතර වෙනස්කම් 2 ක් දක්වන්න.

iv) සියදාස ශ්‍රී ලංකා රක්ෂණ සමාගමට ගොස් තම මෝටර් රථයේ රක්ෂණ වාරිකය ගෙව්වාය. තවද තම ජංගම දුරකථනයෙන් ස්ටාර් කොම් (Star com) පෞද්ගලික සමාගම අමතා තම ව්‍යාපාරය සඳහා වෙබ් පිටුවක් නිර්මාණය කර ගැනීමට අවශ්‍ය මිල ගණන් සාකච්ඡා කරන ලදී.

අ) ඉහත සිද්ධියේ රක්ෂණයට අදාළ පළමු පක්ෂය හා දෙවන පක්ෂය පිළිවෙලින් නම් කරන්න.

ආ) ඉහත සිද්ධියේ සඳහන් සන්නිවේදන ක්‍රමයක් හා එයට අදාළ සන්නිවේදන මාධ්‍ය පිළිවෙලින් නම් කරන්න.

(ලකුණු 02 x 4 = 08)

2024-09-

04) i) චෙක්පතක් යනු නිර්වචනය කරන්න.

ii) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

අ) පැහැදිලි බව සන්නිවේදන ක්‍රියාවලියට ඇතුළත් මූලිකාංගයකි.

ආ) ව්‍යාපාර අරමුණු අපේක්ෂිත අයුරින් ඉටුකරගැනීම කාර්යක්ෂමතාවයයි.

ඉ) ව්‍යාපාරයකට වඩාත් ආකර්ශනීය ලෙස මෙන් ම ලාභදායීව තෘප්තිමත් කළ හැකි පාරිභෝගික කොටස ඉලක්ක වෙළඳපොළයි.

ඊ) ඉරානයෙන් ඛනිජ තෙල් ප්‍රවාහනය සඳහා වඩාත් සුදුසු ප්‍රවාහන මාධ්‍ය වන්නේ ගුවන් පරිවහනයයි.

iii) නවීන විලාසිතා අනුව විවිධ වර්ගයේ ඇඳුම් / පාවහන්, අත්බෑග් ව්‍යාපාරයක් මාර්ගගත ක්‍රමයට නව මෝස්තර ලබා ගැනීමටත් අලෙවිය වර්ධනය කිරීමේ අරමුණින් ප්‍රචාරණ වියදම් වැඩි කිරීමටත් තීරණය කරන ලදී.

අ) ඉහත සිද්ධියේ ඇතුළත් අලෙවිකරණ මිශ්‍රයේ විචල්‍ය 2 ක් ලියන්න.

ආ) ඉහත (අ) හි ඔබ සඳහන් කළ විචල්‍යවලට අදාළ නිදසුන බැගින් සිද්ධියෙන් උපුටා ලියන්න.

iv) පාසල් දරුවන් සඳහා සෞඛ්‍ය ආරක්ෂිත ලෙස සකසන ලද වතුර බෝතලයක් සකස් කළ විදුර මෙසේ තම අදහස් ප්‍රකාශ කරන ලදී.

A - බෝතලයේ උස 20 cm වේ.

B - මූලික හඳුන්වා දීම පාසල් අසල සිදුකරයි.

C - පිරිවැයට 10% ලාභාන්තිකයක් සහිතව මිල කරයි.

D - ප්‍රචාරණය රූපවාහිනිය මගින් සිදුකරයි.

ඉහත A, B, C, D ප්‍රකාශවල ඇතුළත් අලෙවිකරණ මිශ්‍රයේ විචල්‍යයන් ලියන්න.

Learning Resource Center
R
De Mazenod College
Kandana

***(ලකුණු 02 x 4 = 08)***

## II කොටස

05) i) අ) ගිණුම්කරණයේ ප්‍රධාන අරමුණ කුමක් ද? ***(ල. 01)***

ආ) පහත සඳහන් එක් එක් ගිණුම අයත් වන ගිණුම් වර්ගය සඳහන් කරන්න.

1. ගැනුම් ගිණුම
2. ගැතිලි ගිණුම
3. බැංකු ණය ගිණුම
4. කඩකුලී ගිණුම

***(ල. 02)***

ii) පහත සඳහන් ගනුදෙනු සඳහා ද්විත්ව සටහන් ලියන්න.

අ) ණයහිමි අජේලට රු. 8,000 ක් චෙක්පතකින් ගෙවීම.

ආ) පිරිස් තම ව්‍යාපාරයේ රු. 400 ක භාණ්ඩ තොගයක් පෞද්ගලික ප්‍රයෝජනයට ගෙනයාම. ***(ල. 02)***

iii) දේශාන්ගේ ව්‍යාපාරයේ 2024.08.31 දිනෙන් අවසන් මාසයේ සිදුවූ ගනුදෙනු කිහිපයක් පහත දක්වේ.

- රු. 100,000 ක බැංකු ණයක් ලබා ගැනීම.
- අත්පිට ගැනුම් රු. 25,000
- තම පෞද්ගලික ප්‍රයෝජනය සඳහා රු. 2,000 ක භාණ්ඩ තොගයක් ලබාගැනීම.
- රු. 20,000 ක පිරිවැය වූ තොගයක් රු. 30,000 කට විකිණීම.

අ) එක් එක් ගනුදෙනුව ගිණුම්කරණ සමීකරණයට බලපාන ආකාරය පහත සඳහන් ආකෘතිය යටතේ දක්වන්න.

| ගනුදෙනුව | වත්කම් | | | = හිමිකම + | වගකීම් | |
|---|---|---|---|---|---|---|
| | උපකරණ | + තොගය | + මුදල් | | බැංකු ණය | ණයහිමියෝ |
| 8/1 ශේෂය | 100,000 | 80,000 | 90,000 | 150,000 | 50,000 | 70,000 |
| 1 | | | | | | |
| 2 | | | | | | |
| 3 | | | | | | |
| 4 | | | | | | |

(ල. 02)

ආ) 8.31 දිනට ව්‍යාපාරයේ ජංගම වගකීම් හා ජංගම වත්කම් වල එකතුව දක්වන්න. (ල. 02)

iv) ඉසුරිගේ ව්‍යාපාරයේ සුළු මුදල් සම්බන්ධ තොරතුරු පහත දක්වේ.

2024.06.01 සුළු මුදල් ශේෂය රු. 400

සුළු මුදල් අග්‍රිමයේ වටිනාකම රු. 5,000

| | | |
|---|---|---|
| 6/2 | ලිපිද්‍රව්‍ය | 1,000 |
| 6/4 | ගමන් වියදම් | 400 |
| 6/10 | සංග්‍රහ වියදම් | 200 |
| 6/12 | බස් ගාස්තු | 500 |
| 6/20 | විකුණුමට වැටුප් අත්තිකාරම් ගෙව්වා | 1,200 |
| 6/25 | බීම බෝතලයක් ගත්තා | 700 |
| 6/28 | ලිපිද්‍රව්‍ය | 800 |
| 7/1 | අග්‍රිමය ප්‍රතිපූර්ණය කළා | |

අවශ්‍ය වන්නේ,

ගමන් ගාස්තු, ලිපිද්‍රව්‍ය, සංග්‍රහ වියදම් යන විශ්ලේෂණ තීරු සහිත සුළු මුදල් පොතක් පිළියෙල කරන්න.

(ල. 03)

(මුළු ලකුණු 12)

06) i) අ) චෙක්පතක් අගරු වීම යනු කුමක් ද? (ල. 01)

ආ) එසේ චෙක්පතක් අගරු විය හැකි අවස්ථා 2 ක් ලියන්න. (ල. 01)

ii) තරංගගේ ව්‍යාපාරයේ 2023.12.31 දිනෙන් අවසන් වූ වසර සඳහා දක්නට ලැබුණු ශේෂය පහත දක්වේ.

| | |
|---|---|
| ඉඩම් හා ගොඩනැගිලි | 50,000 |
| තොගය | 12,000 |
| විදුලි වියදම් | 2,000 |
| සේවක වැටුප් | 10,000 |
| ණයහිමියෝ | 25,000 |
| ණයගැතියෝ | 14,500 |
| බැංකු අයිරාව | 8,000 |

අවශ්‍ය වන්නේ,

තරංගගේ ව්‍යාපාරයේ 2023.12.31 දිනට ශේෂ පිරික්සුමක් ඇසුරින් ප්‍රාග්ධනය ගණනය කරන්න. (ල. 02)

iii) ව්‍යාපාරයක ගිණුම් පොත්වල සිදුවූ වැරදි කිහිපයක් පහත දක්වේ.

1. රු. 8,000 ක ගැනුම් ඉන්වොයිසියක් පොත්වලින් මඟහැරී ඇත.
2. ණයහිමියෙකු වූ සම්පත්ට ගෙවූ රු. 2,600 ක් ඔහුගේ නිවැරදිව සටහන් කර ඇතත් මුදල් පොතේ සටහන් කර නැත.
3. විකුණුම් ජ්නලයට එකතු කිරීමේ දී රු. 900 ක් වැඩියෙන් එකතු කර ඇත.
4. රු. 2,000 ක රක්ෂණ ගාස්තු ගිණුමේ ශේෂය ශේෂ පිරික්සුමට උපුටා ගෙන නැත.

අවශ්‍ය වන්නේ,

i) වැරදි නිවැරදි කිරීමට අවශ්‍ය ජ්නල් සටහන්

ii) අවිනිශ්චිත ගිණුම (ල. 04)

iv) 2023 සැප්තැම්බර් මාසයේ අශාන්ගේ ව්‍යාපාරයේ පිළියෙල කළ බැංකු ගිණුම පහත දක්වේ.

බැංකු ගිණුම

| දිනය | විස්තරය | වටිනාකම | දිනය | විස්තරය | වටිනාකම |
|---|---|---|---|---|---|
| 9/1 | ඉ/ගෙ | 28,000 | 9/20 | කසුන් (චෙ.අ. 080100) | 12,000 |
| 9/3 | මුදල් තැන්පත් | 15,000 | 9/23 | ලසන්ත (චෙ.අ. 080101) | 18,000 |
| 9/19 | සිල්වා (චෙ.අ. 00276) | 12,000 | 9/30 | ශේෂය ප/ගෙ | 25,000 |
| | | 55,000 | | | 55,000 |
| 10/1 | ශේෂය ඉ/ගෙ | 25,000 | | | |

බැංකු ප්‍රකාශය

| දිනය | විස්තරය | හර | බැර | ශේෂය |
|---|---|---|---|---|
| 9/1 | ශේෂය | - | - | 28,000 |
| 9/3 | මුදල් තැන්පතු | - | 15,000 | 43,000 |
| 9/10 | ලාභාංශ ලැබීම් | - | 6,000 | 49,000 |
| 9/25 | චෙක්පත් අංක 080100 | 12,000 | - | 37,000 |
| 9/29 | ස්ථාවර නියෝග (ණය වාරිකය) | 4,500 | - | 32,500 |
| 9/30 | බැංකු ගාස්තු | 1,500 | - | 31,000 |

අවශ්‍ය වන්නේ,

අ) 9/1 දිනට ව්‍යාපාරයේ බැංකු ගිණුමේ ශේෂය සංශෝධනය කිරීම.

ආ) 9/31 දිනට බැංකු සැසඳුම් විස්තරය පිළියෙල කිරීම. (ල. 04)

(මුළු ලකුණු 12)

07) i) අ) ක්ෂයවීම් යනු කුමක් ද? (ල. 01)

ආ) ජංගම නොවන වත්කම් ක්ෂය විය හැකි ආකාර දෙක නම් කරන්න. (ල. 01)

ii) පහත සඳහන් ගැළපුම් වලට අදාළ ජ්නල් සටහන් පෙන්වන්න.

අ) උපචිත විදුලිය රු. 2,000

ආ) ණයගැතියන්ගෙන් රු. 3,000 ක් බොල්ණය ලෙස කපා හැරීම. (ල. 02)

iii) සිල්ලර වෙළඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යන අරවින්දගේ ව්‍යාපාරයේ 2023.12.31 දිනට ශේෂ පිරික්සුම පහත දක්වේ.

| | හර | බැර |
|---|---|---|
| ගැනුම් | 225,000 | |
| විකුණුම් | | 350,000 |
| ලිබඩු උපකරණ (පිරිවැය) | 100,000 | |
| 2023.01.01 තොගය | 10,000 | |
| 12% බැංකු ණය | | 100,000 |
| වරිපනම් | 8,000 | |
| ගෙන ඒමේ කුලී | 6,500 | |
| ප්‍රචාරණය | 7,500 | |
| ඉඩම් හා ගොඩනැගිලි (පිරිවැය) | 500,000 | |
| ලද වට්ටම් | | 8,000 |
| ණයගැතියෝ | 25,000 | |
| ණයහිමියෝ | | 22,000 |
| බැංකු ණය පොලිය | 9,000 | |
| වේතන | 12,000 | |
| අත ඉතිරි මුදල් | 8,500 | |
| බැංකු ශේෂය | 25,000 | |
| ප්‍රාග්ධනය | | 460,000 |
| දුන් වට්ටම් | 3,500 | |
| | 940,000 | 940,000 |

පහත සඳහන් තොරතුරු ඔබට සපයා ඇත.

1. 2023.12.31 දිනට ඉතිරි තොගය රු. 25,000
2. ලිබඩු වාර්ෂිකව 10% ක් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරන්න.
3. ණයගැතියන්ගෙන් රු. 2,000 ක් බොල් ණය ලෙස කපා හරින්න.
4. 2023.12.31 දිනට වරිපනම් ගාස්තු රු. 1,500 ක් උපචිතව ඇත.

අවශ්‍ය වන්නේ,

1. 2023.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශනය
2. 23.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

*(ල. 08)*

*(මුළු ලකුණු 12)*

REGISTRAR
De Mazenod College
Kandana.